**සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී

  ලදී

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ  අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ඉදිරිපත් කිරීම අගයන ලදී

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජංගම නොවන වගකීම් යටතේ ඇති සේවක ප්‍රතිලාභ වගකීම් වෙනුවෙන් තබා ඇති ස්ථාවර තැන්පතු සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය රු.838,937 ක් වැඩියෙන් දක්වා තිබුණි. එම හේතුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ලාභය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ආයෝජන වටිනාකමද රු.838,937 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ස්ථාවර තැන්පතුවෙහි පොලිය 2021.12.31 දිනට ගණනය කිරීමේදී දින ගණනක වෙනසක් සිදු වී ඇත. මෙම ස්ථාවර තැන්පතුව 2021.06.07 සිට 2022.06.07 දක්වා කාලය පවතින බැවින් එය කල්පිරීමේ දී බැංකුව විසින් ලබා දෙන පොලිය ගණනය කර වර්ෂ අවසාන ගිණුම් පිළියෙල කිරීමේ දී මෙම වෙනස නිවැරදි කරනු ලැබේ. | වර්ෂයට අදාළ පොලිය නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය වෙන්කිරීමේ ගිණුම තුළ ඇතුළත්ව තිබූ රු.1,757,377 ක් වූ වැඩියෙන් ගිණුම්ගත කර තිබූ ක්ෂයවීම් නිවැරදි කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ක්ෂයවීම් රු.1,757,377 කින් අඩුවී තිබුණි. | මෙම විමසුමේ සඳහන් රු.1,757,377 ක ගිණුම් සටහන් සමඟ එකඟ වන අතර, මෙම වෙනස සමුච්චිත ක්ෂය ගිණුමේ පැවැති වෙනස වේ. මෙම වෙනස ප්‍රවර්ථන වර්ෂයේ දී ක්ෂය ගිණුම අතර නිවැරදි කිරීම සිදු කර ඇත.<br><br>LKAS 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් ප්‍රවර්ථන වර්ෂයට ගිණුම්ගත කරන ලෙස දක්වා ඇත. සමාලෝචිත වර්ෂයට අදාළ ගැලපීම් සිදු කර ඇත. | ඉකුත් වර්ෂයට අදාළව වැඩියෙන් ගණනය කර තිබුණු ක්ෂය ප්‍රමාණය සමාලෝචිත වර්ෂයට අදාළ තථ්‍ය ක්ෂය වීම්වලින් අඩු නොකළ යුතු වීම. |
| (ඇ) | 2018 නොවැම්බර් 08 දින මණ්ඩලය වෙත ලැබී තිබුණ දැනට භාවිත කරමින් පවතින දිනුම් ඇදීමට යොදා ගනු ලබන බෝලවල තත්ත්වය පරීක්ෂා කරන යන්ත්‍රය (Drawing Ball Validation Machine) 2021 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලයේ වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | Drawing Ball Validation Machine යන අයිතමය, 2018 වර්ෂයේ දිනුම් ඇදීමේ යන්ත්‍රය සමඟ අයකිරීමකින් තොරව සැපයුම්කාර ආයතනය විසින් ලබා දී ඇත. ස්ථාවර වත්කම් ලේඛනයට 2022 වර්ෂයේ ඇතුළත් කර ඇත. ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට කටයුතු යොදනු ලැබේ. | මණ්ඩලයට අයත් සියළු වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ජංගම දුරකථන 84 ක වටිනාකම රු.286,350 ක් ලෙස 2019 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි. එම ජංගම දුරකථන, කාර්යාල උපකරණ වත්කම් කාණ්ඩය යටතේ ගිණුම්ගත කර තිබුණි. ජංගම දුරකථන සියයට 50 ක්ද හා කාර්යාල උපකරණ සියයට 25 ක්ද වශයෙන් ක්ෂය කිරීම මණ්ඩලයේ ප්‍රතිපත්තිය වී තිබුණි. ජංගම දුරකථන, කාර්යාල උපකරණ වත්කම් කාණ්ඩය යටතේ ගිණුම්ගත කර තිබීම නිසා වාර්ෂිකව සියයට 25 බැගින් ක්ෂය කර තිබුණි. නමුත් ජංගම දුරකථන සියයට 50 ක් බැගින් ක්ෂය කළේ නම් 2020 වර්ෂය අවසාන වන විට එහි ශුද්ධ වටිනාකම ශුන්‍ය අගයක් ගත යුතුව තිබුණු අතර එම වරද සමාලෝචිත වර්ෂයේදී ගැලපුවේ නම් ඉකුත් වර්ෂයට අදාළව රු.143,175 ක් සමුච්චිත අරමුදල හර කර ක්ෂය | 2012 වර්ෂයට පෙර මණ්ඩලය මගින් ජංගම දුරකථන, කාර්යාල උපකරණ ගිණුම තුළ වර්ගීකරණය කර දැක්වීම නිසා උක්ත ගැටලුව මතු වී ඇත. මෙම ගිණුම්වල සටහන් වී ඇති පැරණි වත්කම් හඳුනාගැනීම සඳහා මේවන විටත් අභ්‍යන්තර විගණන අංශයේ මැදිහත් වීමෙන් වත්කම් සංගණනයක් සිදුවෙමින් පවතී. මේ තුළින් සත්‍යාපනය නොවන වත්කම් ඉවත්කර අදාළ ගැලපුම් ඉදිරියේ දී සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | මිලදී ගනු ලබන වත්කම් නිවැරදි කාණ්ඩ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වෙන්කිරීමේ ගිණුම බැර කළ යුතුව තිබුණි. එසේ නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂයවීම් රු.71,588 ක් වැඩියෙන්ද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම දුරකථනවල ශුද්ධ වටිනාකම රු.71,588 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඉ) | ණයගැතියෙකු විසින් රු.1,354,016 ක ගෙවීම පැහැර හැර තිබුණු අතර එම මුදල අයකර ගැනීමට මණ්ඩලය විසින් නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශවලින් හෙළිදරව් කර නොතිබුණි. | ණයගැතියාගෙන් අයවිය යුතු රු.1,354,016 කට අදාළව බැංකු ඇපකර මඟින් ලබා ගැනීම සඳහා වන ලිපි 2019 ජුනි 12 සණස බැංකුව උකුවෙල ශාඛාවට ලබා දී ඇත. නමුත් බැංකුව විසින් බැංකු ඇපකර කොන්දේසි උල්ලංඝණය කර ගෙවීම පැහැර හැර ඇත. එබැවින් මණ්ඩලය විසින් මේ වන විට අංක DMR 875/21 නඩුවක් ගොනුකර ඇත. මෙම නඩුව පිළිබඳව 2022 මූල්‍ය ප්‍රකාශවලින් හෙළිදරව් කරනු ලැබේ. | නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති ගනුදෙනු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතු වීම. |
| (ඊ) | වර්ෂයක් ඉක්මවන ලද රු.1,354,016 ක ණයගැතියකු සඳහා 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අඩමාන ණය වෙන්කිරීමක් කර නොතිබුණි. | මෙම ණයගැතියාගෙන් අයවිය යුතු රු.1,354,016 ක් අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත. මණ්ඩලයේ මතය අනුව මෙම මුදල් අය කර ගැනීමේ අවධානමක් 2021 දෙසැම්බර් 31 දින වන විට නොපැවතිය බැවින් මේ සඳහා අඩමාන ණය වෙන් කිරීමක් කර ගිණුම්වල සටහන් තැබීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. | 2019 වර්ෂයේ සිට හිඟහිටිව පවතින ශේෂයක් බැවින් ඒ සඳහා අඩමාණ ණය වෙන්කිරීමක් කළ යුතු වීම. |
| (උ) | දැනට භාවිතා කරමින් පවතින කෑම කාමරය, ගබඩා කාමරය හා තාප්පය නැවත සකස් කිරීම සඳහා 2018 වර්ෂයේ දී වැය කරන ලද පිළිවෙලින් රු.1,336,676 ක්, රු.246,918 ක් හා රු.145,290 ක් වශයෙන් එකතුව රු.1,728,884 ක් කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත්ව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අයිතමයන් ප්‍රාග්ධනිත කර ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | සැලසුම් කරන ලද ඉදිකිරීම් සිදු කිරීමේ මූලික කටයුතු වෙනුවෙන් මෙම මුදල් වැය වී ඇත. නමුත් අවස්ථා කිහිපයකදී එම ඉදිකිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළද විවිධ හේතූන් මත එය ඉටු කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් මෙම කෙරීගෙන යන වැඩ අවසන් කිරීම සඳහා මෙම වර්ෂයේ අයවැය තුළින්ද මුදල් වෙන් කිරීමක් සිදු කරන ලදී. නමුත් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 03/2022 | කාර්ය නිමකර වත්කම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

වක්‍රලේඛයේ සඳහන් කර ඇති පරිදි අත්‍යාවශ්‍ය නොවන ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා ඇත. ඒ අනුව මෙම වර්ෂයේද මෙම ඉදිකිරීම් සිදු කිරීමට නොහැකි වන අතර ඉහත වක්රලේඛය ලිහිල් කිරීමෙන් පසු අදාළ ඉදිකිරීම් කරනු ලැබේ.

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| | විෂය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | බෙදාහැරීමේ නියෝජිතයින් විසින් ලබාගත් රු.20,150,000 ක් වටිනා ලොතරැයිපත් සඳහා බැංකු ඇපකර තැබීම. | බැංකු ඇපකරවලට අදාළ ලියවිලිවල මුල් පිටපත් | ඉදිරියේ දී අදාළ බැංකුව විසින් බැංකුව විසින් බැංකු ඇපකරය දීර්ඝ කර ලබාදෙන මුල් පිටපත දීර්ඝ කළ දින සිට දින 14 ක් ඇතුළත ආයතනය වෙත ලබා දිය යුතු බව දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් දැනුවත් කර එය විධිමත් කිරීමට කටයුතු කරන ලබන අතර එය නොලැබුණ හොත් තාවකාලිකව අදාළ බෙදාහැරීමේ අලෙවි නියෝජිත ගිණුම පරිගණක පද්ධතිය මගින් අක්‍රීය කිරීමට ද ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | බැංකු ඇපකර වලට අදාළ ලියවිලිවල මුල් පිටපත් ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ස්ථාවර තැන්පතු වෙනුවෙන් රඳවා ගන්නා ලද රු.207,423 ක බදු මුදල් | රඳවා ගන්නා ලද බදු මුදල් සඳහා බැංකු සනාථ කිරීම් | රඳවාගැනීමේ සහතිකපත් සම්බන්ධව බැංකු සඳහා ලිපි මඟින් දැනුවත් කර ඇති අතර මේ වන විටත් රු.3,039,128 ක් වටිනා සහතික පත් අප වෙත ලැබී ඇත. තවදුරටත් රු.207,423 ක අදාළ සහතික පත් අදාළ බැංකුවලින් මේ දක්වා ලබා දී නොමැති අතර මේ පිළිබඳ ඉදිරියේ දී අදාළ බැංකු වෙත ලිපි මඟින් දැනුවත් කර රඳවා ගැනීමේ සහතිකපත් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | රඳවා ගැනීමේ බදු මුදල් සඳහා අදාළ සහතික පත් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ස්ථාවර වත්කම් පිළිබඳ උපලේඛනයේ රු.7,464,727 ක් වටිනා මුළුමනින්ම ක්ෂය කළ වත්කම් | මුළුමනින්ම ක්ෂය කර තිබුණු වත්කම් පිළිබඳ ලේඛනය | පෙන්වා දී ඇති වෙනස සමඟ එකඟ වේමෙම පෙන්වා දී . ඇති ශේෂයන් ඉතා පැරණි ශේෂයන් වන අතරඉදිරියේදී , ගිණුම්වලින් කපා හැරීමක් සිදු .කිරීමට කටයුතු කරනු ලැබේ | එකතු වටිනාකමක් වශයෙන් දක්වා ඇති වත්කම් වෙන වෙනම ලේඛනගත කළ යුතු වීම. |
| (ඇ) | 2015 වර්ෂයේ දී දින දර්ශන වෙනුවෙන් ගෙවිය යුතු රු.2,353,650 ක වියදම් | ඉන්වොයිස් | මෙහි සඳහන් 2015 දින දර්ශන සඳහා රු.2,353,650 ක් ගෙවිය යුතු වියදමක් වන අතර එයට අදාල ඉන්වොයිස් පත්වල පිටපත් ගිණුම් අංශය සතුව ඇතසම්පාදන අංශයේ එය ප්‍ර . ලීම පරිදිඉල්2014 වර්ෂයේ උපචිත වියදම් සඳහා ඇතුළත් කර ඇත මෙම .උපචිත වියදම අවලංගු කර ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | කල් ඉකුත්වූ ගෙවා නොමැති වියදමක් බැවින් එය ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් මාසයේ සිට කුලී පදනම මත ලබා ගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒක පාර්ශිකව කඩ කර තිබුණි. මේ නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක යන මුදල්වල එකතුව වන රු.5,700,000 දැනට වර්ෂ 16 ක් මුළුල්ලේ අය කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | මුදල් අමාත්‍යාංශය විසින් පත් කළ කමිටුවෙන් ලබා දී ඇති නිර්දේශය ක්‍රියාත්මක කරන ලෙස මුදල් අමාත්‍යාංශයේ නීති අංශය මඟින් උපදෙස් ලබා දී ඇති බැවින් ඒ අනුව කටයුතු කරමින් පවතී. | අදාළ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇති කර ගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අය කර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 | මෙම මුදල අය කර ගැනීම සඳහා වන නීතිමය ක්‍රියාමාර්ග ගැනීම නීතිපති දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි. මෙම මුදල අයකර ගැනීම සඳහා ඍජු පාර්ශවකරු මේ වන විට මිය ගොස් ඇති බැවින් ඔහුගේ පුතා සහ බිරිඳ මෙම නඩුවට සම්බන්ධ | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| දින ලැබී තිබුණි. අදාළ මුදල අයකර ගන්නා ලෙස නඩු තීන්දුව ප්‍රකාශ වී වර්ෂ 06 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | කර ගැනීම සිදුකර ඇති අතර ඔවුන් වෙත මෙම මුදල ගෙවන ලෙස එන්තර වාසියක් නීතිපති දෙපාර්තමේන්තුව මගින් යොමු කර ඇත. | |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලාා ප්‍රකාශනවල වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ යටතේ ණයහිමි ශේෂය ලෙස රු.324,823,802 ක් ලෙස දක්වා තිබුණි. 2022 මැයි 31 දින වන විට එම ශේෂය රු.43,656,155 වී තිබුණි. එම ශේෂය තුළ සමාලෝචිත වර්ෂයට අදාළ රු.29,146,198 ක ණය ශේෂයක්ද, වර්ෂයක් පැරණි රු.1,222,935 ක ණය ශේෂයක්ද, වර්ෂ.ක් පැරණි රු 02 8,382,316 ක ණය ශේෂයක්ද සහ වර්ෂක් හෝ 3 .ට්ට වඩා පැරණි රු4,904,706 ක ණය ශේෂයක්ද පැවැතුණි. | 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් විගණන අංශයට ලබාදුන් ණයහිමි කාල විශ්ලේෂණයේ සඳහන් ශේෂයන් මෙම විගණන විමසුමේ පෙන්වා දී ඇති ශේෂයන් සමඟ එකඟ වේමෙහි ගෙවිය යුතු ණය . ශේෂය යටතේ වෙළඳ ණයහිමියෝ ලෙස .බෙන රුදක්වා ති324,823,802 ක මුදලින් 2022 වර්ෂය තුළ ගෙවීම් සිදුකර 2022 මැයි මාසය වන විට මෙම ශේෂය රු.43,656,155 දක්වා අඩු වී ඇතඑයින් මෙම ණයහිමි . කාල විශ්ලේෂණයේ පෙන්වා දී ඇති පරිදි පැරණි ණයහිමි ශේෂයන් ආදායමට .ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ | දීර්ඝ කාලයක් මුළුල්ලේ පැවත එන ශේෂ ආදායමට ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |

## 1.6.3 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන සඳහා නවාතැන් පහසුකම් ලබා ගැනීමට 2014 වර්ෂයේදී එක් ආයතනයක් හා පුද්ගලයින් තිදෙනෙකු වෙත එකතුව රු.202,800 ක අත්තිකාරම් ගෙවා තිබුණි. වර්ෂ 08 ක කාලයක් මුළුල්ලේ මණ්ඩලයේ අරමුදල් බාහිර පාර්ශවයන් වෙත රඳවා ගැනීමට ඉඩ දී තිබුණු අතර, එම මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | මෙම මුදල් අය කර ගැනීම සඳහා අවස්ථා කිහිපයක දී මුදල් ගෙවන ලද පාර්ශවය වෙත ලිඛිත දැනුම් දී ඇත. එම මුදල් එම පාර්ශවකරුවන් විසින් මෙතෙක් ගෙවා නොමැති නිසා කඩිනමින් අදාළ මුදල් අය කර ගැනීමට පොලීසියට පැමිණිලි කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත . | අත්තිකාරම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2013 වර්ෂයේ අවස්ථා 3ක දී රු.2,877,144 ක් සහ 2014 වර්ෂයේ දී රු.749,583ක් වශයෙන් එකතුව රු.3,626,727ක් පෞද්ගලික ආයතනයක් වෙත ගොඩනැගිලි සැලැසුම් උපදේශන ගාස්තු ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. වර්ෂ 8 ක සිට වර්ෂ 9 ක් දක්වා කාල පරාසයක් තුළ මණ්ඩලයේ අරමුදල් බාහිර පාර්ශවයක් අත රඳවා ගැනීමට මණ්ඩලය විසින් ඉඩ ප්‍රස්ථා ලබා දී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අදාළ ආයතනයෙන් අත්තිකාරම් මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17(5) වගන්තිය | යම් සංවර්ධන ලොතරැයියක ත්‍යාගලාභීන් නිශ්චය කරනු ලැබූ දින සිට ගණන් බලනු ලැබූ මාස හයක කාලසීමාවක් ඉකුත් වීමෙන් පසුව ඒ ලොතරැයියේ එම ත්‍යාගයට හිමිකම් ලබනු තැනැත්තා සොයා ගැනීමට නොහැකිවීම හේතුවෙන් ඒ ලොතරැයියේ ප්‍රදානය කර නොමැති යම් ත්‍යාගයක් රජය සන්තක විය යුතු අතර, ඉන් පසු එය ජනාධිපති අරමුදලට බැර කළ යුතු වුවත්, 2021 වර්ෂයේ දී එසේ නොකර ත්‍යාග සංචිත අරමුදලට ගෙන තිබූ ත්‍යාග ප්‍රමාණය රු.15,341,900 ක් වී තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි සඳහා ත්‍යාග ලබා දීම පනතේ 17(5) හා 18(3) වගන්තිවල සඳහන් දෙයාකාරව සිදු කරනු ලබයි.<br><br>ත්‍යාග සංචිත ගිණුම භාවිතා කර ලබා දෙන ලද ත්‍යාගවලට හිමිකම් ඉදිරිපත් නොවන ත්‍යාග නැවත එම සංචිත අරමුදලට බැර කළ යුතු බවට නියමයක් නීතිපති දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇත. ඒ අනුව මෙම රු.15,341,900 ක මුදල ත්‍යාග සංචිත අරමුදලට බැර කර ඇත. | පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8 වන වගන්තිය | රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර රාජකාරියේ යෙදී සිටින නිලධාරීන් ඔවුන් එම රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා ධාවනය කරනු ලබන වාහනය වෙනුවෙන් එක කිලෝමීටරයක් සඳහා | ඔවුන්ගේ මෝටර් රථ භාවිතා කරමින් ඔවුන් ඉන්ධන ලබා ගෙන ධාවනය කිරීම වෙනුවෙන් කිලෝ මීටරයකට ඉන්ධන දීමනාව රු.40/- ක් ලෙස | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු. 12ක් පමණක් ගෙවිය හැකි වුව ද, කිලෝ මීටර් එකක් ධාවනය සඳහා මණ්ඩලය විසින් අලෙවි කළමනාකරුවන්ට රු.40 ක් බැගින් එකතුව රු.3,712,160 ක් ගෙවා තිබුණි. | ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත ගෙවා ඇත. එම ගෙවීම සිදු කර ඇත්තේ 2016 අගෝස්තු 29 දින පැවති 205 වන අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේ දී ලබා දුන් අනුමැතිය පරිදි මෙම දීමනාව ලබා දී ඇත. | |
| (ඇ) | මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ 104 | 2021 ජනවාරි 01 දිනට ස්ථාවර වත්කම්වල ඇතුළත් රු.492,392 ක් වටිනා තිස්සමහාරාම ඉඩම 2021 ජූලි 31 දිනැති අංක 2021/07/167 දරන ජර්නල් සටහන මඟින් ඉවත් කර තිබුණි. එසේ කිරීමට 2021 මාර්තු 02 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී තීරණය කර තිබුණි. එම කපා හැරීම සඳහා මු.රෙ. 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම කාවන්තිස්සපුර ඉඩම සංවර්ධනය කිරීමට දරන ලද පිරිවැය කපා හැරීමට අදාළව මුදල් රෙගුලාසී 104 ප්‍රකාරව කටයුතු කර අදාළ පිටපත් කඩිනමින් ලබා දීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | (ii) මු.රෙ 371(2) | සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.2,586,000 ක තත්ත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත ගෙවා තිබුණි. | ප්‍රායෝගිකව පවතින දුෂ්කරතා හේතුවෙන් මෙම ගැටළුව නිවැරදි කිරීමට නොහැක. | මුදල් රෙගුලාසි අනුව සීමාවන් ඉක්මවන්නේ නම් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වීම. |
| | (iii) මු.රෙ 396 | 2021 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වූ එකතුව රු.610,274 ක් වටිනා චෙක්පත් 23 ක් සම්බන්ධයෙන් මු.රෙ.396 (ඇ) ප්‍රකාරව කටයුතු නොකර ගෙවිය යුතු චෙක්පත් ගිණුමක රඳවා ගෙන තිබුණි. | මෙම චෙක්පත් 2022 වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන | චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන්ට පටහැනිව මණ්ඩලය විසින් රු.250,000 ක ආපදා ණය | 2022 ජූලි 01 දිනෙන් පසු ආපදා ණය ලබා දීමේ උපරිමය රු.250,000 ක් දක්වා | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | ජාතික අයවැය චක්‍රලේඛයේ 5.2 ඡේදය | සීමාව ඉක්මවා නිලධාරීන් 145 දෙනෙකු වෙත එකතුව රු.10,487,342 ක ආපදා ණය ගෙවා තිබුණි. | සීමා කිරීමට කළමනාකරණය විසින් තීරණය කර ඇත. | |
| (ඉ) | 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.4,982,000ක් පෞද්ගලික බැංකුවක ආයෝජනය කර තිබුණි. | දැනට මණ්ඩලය සතු බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින්ගෙන් 30 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් මෙම ගිණුමට මුදල් තැන්පත් කරනු ලබන අතර ඔවුන් විසින් තවදුරටත් සිදු කරනු ලබන ඉල්ලීම මත ගිණුම වසා තැබීම මණ්ඩලයේ දෛනික මුදල් රැස්කිරීමේ කාර්යයට බාධාවක් බවත් එසේ කළහොත් දෛනික බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් විසින් නිරවුල් කළයුතු මුදල් ප්‍රමාණය ඉහළ යා හැකි බව නිරීක්ෂණය වේ. | පෞද්ගලික බැංකුවල ආයෝජනයන් සිදුකිරීමට භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වීම. |
| (ඊ) | 2015 ඔක්තෝබර් 26 දිනැති අංක ඩී.එල්.බී/එම්.ටී. කේ/බෙදානි/ චක්‍රලේඛ/2015 /14 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ චක්‍රලේඛය | 2021 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා දින 14 ක ප්‍රමාදයකින් පසුව භාර දුන් සහ 2022 සැප්තැම්බර් 21 දින වන විටත් භාර නොදුන් ලොතරැයි පොත් 42,273 ක් වෙනුවෙන් එක් ලොතරැයි පොතක් සඳහා ප්‍රමාදය වෙනුවෙන් අයකර ගත යුතු රු.25 ක් බැගින් එකතුව රු.1,056,825 ක් අය කර ගත් බව සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2021 ඔක්තෝබර් මාසය වන විට රට විවෘත කිරීමත් සමඟ සභාපතිතුමා ද දැනුවත් කර සාමාන්‍යාධිකාරීතුමාගේ උපදෙස් මත ආයතනයේ රථ යොදවා නොවැම්බර් මාසයේ මැද සිට සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තොග ආපසු එවුම් ගෙන්වා ගන්නා ලදීඑම . තොග පරීක්ෂා කිරීම සඳහා මාස 3 කට අධික කාලයක් ගත විය . කොරෝනා වසංගතය හේතුවෙන් සේවකයින් පොරොත්තු ලේඛනයකට අනුව කැඳවීම නිසා තොග පරීක්ෂා කිරීමද ප්‍රමාද විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

එබැවින් ටිකට්පත් සඳහා වන වලංගු කාලයද ඉක්මවා තිබුණු අතර ඒ සඳහා වන දඩ මුදල් අයකර ගැනීම මේ වන තෙක් සිදු නොවුණි. 2021 නොවැම්බර් මාසයේ සිට නියමිත පරිදි දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලදී.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,953,528,558 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.2,993,501,638 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.39,973,080 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ත්‍යාග සඳහා වියදම් වැඩි වීම, බෙදාහැරීමේ වියදම් වැඩි වීම හා ආදායම් බදු වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| ආදායම්/වියදම් | 2021<br>රු. | 2020<br>රු. | වෙනස<br>රු. | ප්‍රතිශතය<br>සියයට |
|---|---|---|---|---|
| ටිකට්පත් ආදායම් | 15,364,398,498 | 15,033,029,360 | 331,369,138 | 2 |
| වෙනත් ආදායම් | 110,304,701 | 158,323,671 | (48,018,970) | 30 |
| **පිරිවැය** | | | | |
| ත්‍යාග වියදම | 7,865,640,218 | 7,702,515,219 | 163,124,999 | 2 |
| දිනුම් ඇදීමේ වියදම | 542,022,297 | 509,983,411 | 32,038,886 | 6 |
| බෙදාහැරීමේ වියදම | 3,484,491,585 | 3,357,266,425 | 127,225,160 | 4 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ටිකට්පත් විකුණුම් ආදායම රු.331,369,138 කින් හෙවත් සියයට 02 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයේ වෙනත් ආදායම් රු.48,018,970 කින් හෙවත් සියයට 30 කින් අඩු වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ත්‍යාග වියදම රු.163,124,999 කින් හෙවත් සියයට 2 කින් වැඩි වී තිබුණි. 2021 වර්ෂයේදී ටිකට්පත් දිනුම් ඇදීමේ වියදම රු.32,038,886 කින් හෙවත් සියයට 06 කින් වැඩි වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී බෙදාහැරීමේ පිරිවැය රු.127,225,160 කින් හෙවත් සියයට 4 කින් වැඩි වී තිබුණි. එම වැඩිවීමට අලෙවිකරණ ආශ්‍රිත පිරිවැය

රු.3,266,071 කින් හෙවත් සියයට 52 කින් අඩු වීම, ප්‍රචාරණ පිරිවැය රු.44,510,370 කින් හෙවත් සියයට 36 කින් වැඩි වීම සහ බෙදාහැරීමේ පිරිවැය රු.17,951,582 කින් හෙවත් සියයට 12 කින් වැඩි වීම ද හේතුවී තිබුණි

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම්, ලාභදායිත්වය හා ද්‍රවශීලතාවය දැක්වෙන අනුපාත පිළිබඳ විග්‍රහයන් පහත දැක්වේ.

| | 2020 | 2021 |
|---|---|---|
| **මෙහෙයුම් අනුපාත** | **සියයට** | **සියයට** |
| විකුණුම් ආදායමට විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 22 | 23 |
| විකුණුම් ආදායමට විකුණුම් පිරිවැය | 58 | 58 |
| **ලාභදායිත්ව අනුපාත** | | |
| දළ ලාභ අනුපාතය | 42 | 42 |
| ශුද්ධ ලාභ අනුපාතය | 20 | 19 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් අනුපාතය මුළු මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස | 87 | 87 |
| ශුද්ධ ලාභයෙන් ත්‍යාග පවරා තිබීමේ අනුපාතය | 11 | 12 |
| ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය | 0.4 | 2.8 |
| **ද්‍රවශීලතා අනුපාතය** | | |
| ජංගම අනුපාතය | 1:1.664 | 1:1.296 |
| ක්ෂණික අනුපාතය | 1:1.637 | 1:1.271 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ හිටපු සභාපතිවරයෙකු විසින් මණ්ඩලයේ නමින් පෞද්ගලික ආයතනයකින් නවීන මිට්සුබිසි L200 කැබ් රථයක් මුදල් නොගෙවා රැගෙන ගොස් තිබුණි. එම කැබ් රථය වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් අදාළ ආයතනය වෙත එකතුව රු.16,842,554 ක් ගෙවා තිබුණි. එම මුදල හිටපු සභාපතිවරයාගෙන් අය කර ගැනීමට මණ්ඩලය විසින් නෛතික කටයුතු සිදු කරමින් පැවතුණ ද, එම නඩු කටයුත්ත පිළිබඳ තොරතුරු මූලා ප්‍රකාශනවලින් හෙළිදරව් කර තිබුණ ද, | එකඟ වේ. 2022 ගිණුම් වර්ෂයේදී අය කර ගත යුතු මුදල වන රු.16,842,554 ක මුදල ගිණුම් වාර්තාවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | වාහනය මණ්ඩලය වෙත ලබා ගැනීම හා වැඩිපුර ගෙවන ලද මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

අය කර ගත යුතු මුදල පිළිබඳ තොරතුරු දක්වා නොතිබුණි.

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි ලෙස ඇස්තමේන්තු නොකිරීම නිසා එකතුව රු.41,537,940 ක් වැය කර මුද්‍රණය කළ ලොතරැයි ටිකට්පත්වලින් ටිකට්පත් 9,193,750 ඉතිරි වී තිබුණු අතර තවත් ලොතරැයිපත් 41,537,940 ක් නොවිකිණී ඉතිරි වී තිබුණි. | 2020වර්ෂය ආරම්භයේ සිට 2021 දෙසැම්බර්මාසය දක්වා රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් වරින් වර රට වැසීම මෙන්ම, මෙම සෞඛ්‍ය වාතාවරණය හේතුවෙන් ජනතාව නගරවලට නොපැමිණීමලොතරැයි මිල දී , ගැනීම පාරිභෝගිකයා සීමා කිරීම, අලෙවි කිරීමේ දී පැවති දුෂ්කරතා හේතුවෙන් අලෙවිය සම්පූර්ණයෙන් අඩු විය. 2021වර්ෂයේ දින ක් 80 ලද අතර දිනුම් ඇදීම් සිදු නොකරන ත එම අවලංගු කළ දින වලට මුද්‍රි ලොතරැයිපත් ඉදිරි මාසවල දී ත ටිකට්පත් ලෙස පැරණි දින මුද්‍රි .අලෙවි කරන ලදි | නිවැරදි හා තාත්ත්වික ලෙස ඇස්තමේන්තු කර ලොතරැයිපත් මුද්‍රණය කළ යුතු වීම. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ලොතරැයි මණ්ඩලය නමින් ලියාපදිංචි කර තිබුණු වාහන ලැයිස්තුව සමඟ සංවර්ධන ලොතරැයි මණ්ඩලය මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබුණු වාහන ලැයිස්තුව සැසඳීමේදී මෝටර් රථ දෙපාර්තමේන්තුවේ සඳහන් වාහන 37 ක් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොතිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අපහරණය කර ටෙන්ඩර් මඟින් අලෙවි කරන ලද මෝටර් රථ වලින් කොටසක් මිලදී ගත් පාර්ශවයන් විසින් ඒවා ලියාපදිංචියට මේ වන තෙක් ඉදිරිපත් නොකර තිබීම නිසා එම මෝටර් රථ මණ්ඩලයේ නමින් වර්තමානය තෙක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පැවතීම නිසා මෙම ගැටළුව පැන නැගී ඇතමේ වන විට මෙම . මෝටර් රථ37 අතරින් මෝටර් රථ 22 කට සම්බන්ධ ලිපි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇතඅනෙකුත් . මෝටර් රථ සම්බන්ධ තොරතුරු | අපහරණය කර ඇති වාහන පිළිබඳ තොරතුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු වෙත කාලීනව යැවිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | කඩිනමින් ඉදිරිපත් කර මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති එම මෝටර් රථවල ලියාපදිංචිය ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | |
| (ආ) | 2021 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු.256,585,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර ඉන් සියයට 12.4 ක් හෙවත් රු.31,822,204 පමණක් ප්‍රාග්ධන වියදම් වශයෙන් පමණක් වැය කර තිබුණි. | එකඟ වේ. ජාතික අයවැය දෙපාර්තමේන්තු අංක 07/2019 , 07/හා 03 2020/ 2021දරන චක්‍රලේඛ ප්‍රකාරව අත්‍යාවශ්‍යය නොවන සියළු ප්‍රාග්ධන වියදම් සීමා කරන ලෙස උපදෙස් ලබා දී තිබීම හේතුවෙන් අත්‍යාවශ්‍යයෙන් සිදුකළ යුතු ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමක් සිදුකර ඉතිරි ප්‍රාග්ධන වියදම් සිදු නොකරන ලදී. | නිවැරදි හා තාත්ත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | මණ්ඩලය විසින් 2012 වර්ෂයේ දී චිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා රු.38,752,448 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් චිත්‍රාගාරයක් ඉදිකිරීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු නොකර එය නිෂ්ක්‍රියව පැවැතුණි. | දැනට ස්ථාපිත කර ඇති චිත්‍රාගාරය තුළින් එම අරමුණ ඉටු කර ගැනීමට තව දුරටත් විශාල පිරිවැයක් දැරීමට සිදු වන්නේ දැයි තහවුරු කර ගැනීමට පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර ගැනීම සඳහා ජාතික රූපවාහිනී සංස්ථාවෙන් වාර්තාවක් ලබා ගන්නා ලදී .එම වාර්තාවේ සඳහන් නිරීක්ෂණ 2021.01.29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ අතර, ඉදිකර ඇති චිත්‍රාගාරය ශ්‍රවනාගාරයක් ලෙස පවත්වා ගැනීමට කටයුතු කරනු ලබයි. | අපේක්ෂා කරන අරමුණු ඉටුවන පරිදි පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ඈ) | 2019 වර්ෂයේ මණ්ඩලය සතු යතුරු පැදි 06 ක වටිනාකම රු.305,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි. එම යතුරු පැදි 06, 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කාර්යාල පරිශ්‍රයේ රථගාල තුළ භාවිතයකින් තොරව පැවැතුණි. | යතුරු පැදි 05 ක් අපහරණය කිරීමට කටයුතු කරන අතර අනෙක් යතුරු පැදිය ධාවනය කිරීමට හැකි මට්ටමින් පවතී. | ධාවන තත්ත්වයේ ඇති යතුරුපැදිය මණ්ඩලයේ කටයුතුවලට යෙදවිය යුතු වීම හා අනෙක් යතුරුපැදි අපහරණය කිරීම කඩිනමින් කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | 2021 මාර්තු 25 දිනැති අංක 2021/03/1768 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවකට අලෙවි බලකායේ අධීක්ෂණ කටයුතු පවරා තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ | කොරෝනා අවදානම පැවති කාලසීමාවේ දී මණ්ඩලය අලෙවි නියෝජිතයින් හමු වී ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීමට නොහැකි විය. මේ සම්බන්ධයෙන් 2021 මාර්තු 28 දින අධ්‍යක්ෂ මණ්ඩල | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කාර්යභාර්ය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික පාලනය සම්බන්ධ මාර්ගෝපදේශයේ (GUIDLINES ON CORPORATE GOVERNANCE FOR STATE OWNED ENTERPRISE) දක්වා ඇති තොරතුරුවලට පරිබාහිරව කටයුතු කරන්නේ නම් ඒ සඳහා අනුමැතිය ලබාගත යුතුව තිබුණි. එවැනි අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව එම කාර්ය ඉටු කිරීම සඳහා මණ්ඩලයේ වාහනයක් සහ කොන්ත්‍රාත් පදනමින් මාස 06 ක් සඳහා රියදුරෙකු බඳවා ගෙන තිබුණි. 2021 අප්‍රේල් මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා කාලසීමාව සඳහා එකතුව රු.407,712 දළ වැටුපක් රියදුරු හට ගෙවා තිබුණි. | රැස්වීමේදී ඒ සඳහා කෙටිකාලීන විසඳුමක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කළ අතර, අලෙවි නියෝජිතයින් හමුවී ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීම සිදු කළ යුතු බවට නිරීක්ෂණය විය. ඒ සඳහා මණ්ඩලය සතු වාහනයක් යෙදවීමටත් එම වාහනය ධාවනය කිරීමට රියදුරෙකු නොමැති බැවින් කොන්ත්‍රාත් පදනම මත රියදුරෙකු අනුයුක්ත කර මාස 06 ක කාලයක් සඳහා ඒ වෙනුවෙන් රු.407,712 ක වැටුපක් ගෙවා තිබුණි. වර්තමානයේ මෙම අධ්‍යක්ෂකවරියගේ සේවය ලබා ගැනීමක් සිදු නොකරන අතර එම රථය මණ්ඩලයට ලබා දී ඇත. | |
| (ඊ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආරම්භයේ සිටම පරිපාලන හා මෙහෙයුම් කටයුතු සම්බන්ධව කාර්ය පරිපාටි සංග්‍රහයක් සකස් කර නොතිබුණු අතර එම කාර්යය සඳහා 2016 වර්ෂයේදී සුදුසුකම්ලත් අයෙකු පත්කර තිබුණි. අදාළ පාර්ශවය විසින් පවත්නා නීති රීති අධ්‍යයනය කර අදාළ කාර්යය පරිපාටි සංග්‍රහය පිළියෙල කර 2019 ඔක්තෝබර් 14 දින සංවර්ධන ලොතරැයි මණ්ඩලයට භාරදී තිබුණි. මෙම කාර්යය වෙනුවෙන් රු.4,500,000 ක් අදාළ පාර්ශවයට ගෙවීමට එකඟ වී තිබුණු අතර ඉන් රු.1,700,000 ක් මේ වන විට ගෙවා තිබුණි. ඔහු විසින් අදාළ කාර්යය පරිපාටි සංග්‍රහය කොටස් දෙකකින් යුතුව මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණද මණ්ඩලයේ දැනට පවතින ක්‍රමවේදයට අනුකූල නොවන ලෙස මෙම කාර්යය පරිපාටි සංග්‍රහය සකස් කර ඇති බවට හේතු දක්වා ඉතිරි මුදල ගෙවීම අත්හිටුවා තිබුණි. තවද මෙම කාර්යය සඳහා අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන්ව තිබූ ‘‘ලොතරැයි හා දිනුම් ඇදීමේ කටයුතු, අභ්‍යන්තර පාලනය සහ විගණන කටයුතු’’ සඳහා වූ රීතීන් සකස් කිරීම යන කාර්යයන් | රීතීන් සම්බන්ධව කෙටුම්පත් වාර්තාව සිංහල භාෂාවට පරිවර්තනය කිරීම මේ වන විට අවසන්ව ඇති බවත් ආයතනයේ කළමනාකාරිත්වය මේ පිළිබඳව සාකච්ඡා කර තවදුරටත් නිවැරදි විය යුතු ස්ථාන නිවැරදි කර හැකි ඉක්මනින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද පසු දමිළ බසට පරිවර්තනය කිරීම සිදු කරනු ලැබේ. | පනත අනුව මණ්ඩලයට අවශ්‍ය රෙගුලාසි සකස් කර අනුමත කර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අත්හිටුවන ලෙස මණ්ඩලය විසින් එය සකස් කළ පාර්ශවය වෙත දන්වා තිබුණි. ඒ අනුව අදාළ කාර්යය මේ වන තෙක් නිමවී නොතිබුණු අතර ඒ සඳහා වැයකර තිබු මුදල සකසුරුවම් නොවූ ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය. තව ද මෙම කාර්ය සඳහා අත්සන් කරන ලද ගිවිසුම් කොන්දේසි කඩ කිරීම සහ ගෙවිය යුතු ඉතිරි මුදල පිළිබඳව නෛතික අවදානමක් පවතින බවද විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| (උ) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව දිනුම් ඇදීමේ යන්ත්‍ර ක් පැවැතුණු අතර, 10 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අනුව 15 ක් පැවැතුණි. ඒ අනුව එවැනි යන්ත්‍ර 05 ඇදීමේ යන්ත්‍ර මණ්ඩලය සතු දිනුම් ක් වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මෙම දිනුම් ඇදීමේ යන්ත්‍ර මණ්ඩලයේ ඉතා පැරණි කාර්මික දෝෂ සහිත යන්ත්‍ර වන අතර, මේ වන විට එම යන්ත්‍ර දිනුම් ඇදීමේ කටයුතු සඳහා භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවති. එබැවින් මෙම දිනුම් ඇදීමේ යන්ත්‍ර නැවත ගිණුම් ගත කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. මෙම පැරණි දිනුම් ඇදීමේ යන්ත්‍රය කෞතුක භාණ්ඩ වශයෙන් ප්‍රදර්ශනය කිරීම සඳහා බලාපොරොත්තු වේ. | මණ්ඩලය සතු වත්කම් නිවැරදි ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතු වීම. |
| (ඌ) | 2021 ජනවාරි 01 දිනට ශුන්‍ය වටිනාකමක් වී තිබුණු රු.35,438,340 ක පිරිවැය වටිනාකමක් සහිත දැනට භාවිතයේ පවතින වත්කම්, සමාලෝචිත වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය 2019 ජනවාරි 01 දිනට සිදු කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 35 වන වගන්තිය අනුව වත්කම් ප්‍රත්‍යාගණනය වර්ෂ 03-05 අතර කාලයක් තුළ සිදු කළ යුතු බව සඳහන් වේ. එබැවින් 2019 වර්ෂයේ සිට වර්ෂ 5 ක් සම්පූර්ණ වන 2024 මූල්‍ය වර්ෂයේ දී නැවත ප්‍රත්‍යාගණනයක් සිදු කර අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත. | ශුන්‍ය වටිනාකම් සහිත වර්තමානයේ ක්‍රියාකාරීත්වයේ පවතින වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් විසින් විකිණීම සඳහා මණ්ඩලයෙන් ලබා ගෙන අලෙවි කිරීමට නොහැකිව ඉතිරි වූ 422,730 ලොතරැයිපත් දිනුම් ඇදීමෙන් | 2021 ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් විසින් විකිණීම සඳහා මණ්ඩලයෙන් ලබා ගෙන අලෙවි කිරීමට නොහැකිව ඉතිරි වූ ටිකට් පොත් | ඉතිරි ටිකට්පත් සම්බන්ධයෙන් මණ්ඩලය හඳුන්වා දුන් ක්‍රමවේදය අනුව කටයුතු කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | අනතුරුව දින 14 කාලයක් ගත වී තිබුණත්, එම ලොතරැයි පත් මණ්ඩලය වෙත ලබා දී නොතිබුණි. ඒ අනුව එසේ ආපසු ලබා නොදුන් ලොතරැයි පත් අලෙවි කර නොමැති බව සනාථ කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. | 77,031 නැවත මණ්ඩලයට භාර දී නොමැත. ඉදිරි දින 7 තුළ අලෙවි නියෝජිතයන් දැනුවත් කර ලිපියක් යැවීමට කටයුතු කරන අතර ඒ කාලසීමාව ඇතුළත ආපසු ටිකට්පොත් ලබා දීමට නොහැකි වුවහොත් දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලබයි. | වීම. |
| (ආ) | කොරෝනා වැනි ව්‍යසන කාලපරිච්ඡේදවලදී භෞතිකව ටිකට්පත් අලෙවි කිරීමේ දුෂ්කරතාවයට යම් විසඳුමක් ලෙස E ටිකට්පත් සංකල්පය යොදා ගෙන තිබුණි. නමුත් 2021 වර්ෂයේ දී එක් එක් ලොතරැයියෙන් අලෙවි කළ මුළු ලොතරැයිපත් ප්‍රමාණයෙන් සසිරි ලොතරැයිපත් වලින් සියයට 0.2 ක්ද, ලග්න වාසනා ලොතරැයියෙන් සියයට 0.2 ක්ද, සුපර්බෝල් ලොතරැයියෙන් සියයට 0.3 ක්ද, ශනිදා වාසනාව ලොතරැයියෙන් සියයට 0.2 ක් වශයෙන් E ලොතරැයි පත් අලෙවිය අඩු ප්‍රතිශතයක් වාර්තා වී තිබීම නිසා E ටිකට්පත් සංකල්පය අසාර්ථක වී තිබුණි. | පසුගිය කාලය තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ඩිජිටල් ලොතරැයි යෙදවුම ජනතාව අතරට ගෙන යාමේ යම් යම් ප්‍රායෝගික ගැටළු පැවතුණි. එනම් මෙම App එක අපගේ ඉලක්ක පාරිභෝගික ජනතාවට හුරු කර වීම සඳහා ඔවුන් වෙත ගොස් එම යෙදවුම ජංගම දුරකථනවලට සෘජුවම ඇතුළත් කළ යුතුය. ඒ සඳහා රටේ පැවති සෞඛ්‍ය වාතාවරණය තර්ජනයක්ව තිබුණි. එබැවින් මෙම යෙදවුම තවදුරටත් ජනතාව අතර ප්‍රචලිත කිරීමේ ප්‍රායෝගික ගැටලුවක් පැවතුණි. | E ලොතරැයිපත් වෙළඳපොලට හඳුන්වාදී අලෙවිය වැඩි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | මණ්ඩලය විසින් Sweep App හරහා ලොතරැයිපත් නිකුත් කිරීම සඳහා රු.3,275,246 ක් වැය කර තිබුණි. මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන ලොතරැයිපත් පෞද්ගලික ආයතන දෙකක් මඟින් මුද්‍රණය කරනු ලබයි. එම පෞද්ගලික ආයතන දෙකින් එක් අයතනයක් විසින් මුද්‍රණය කරනු ලබන ලොතරැයිපත් එම App එක මඟින් අලෙවි කිරීමට එම පෞද්ගලික ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. මේ නිසා APP එක වෙනුවෙන් සිදු කළ වියදම සම්පූර්ණ ලෙස ප්‍රයෝජනයට ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. | මෙම ඩිජිටල් ලොතරැයිපත හඳුන්වා දෙන වකවානුව වන විට ටෙන්ඩර් කැඳවීමකින් තෝරා ගත් මුද්‍රණ කරුවකු සිටි අතර ඒ සඳහා ඔවුන්ගේ ටෙන්ඩර්පත්වල මෙම ඩිජිටල් ලොතරැයිය සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම පිළිබඳ කොන්දේසි අඩංගු නොවීම හේතුවෙන් එක් සැපයුම්කරුවෙක් එම පහසුකම් ලබා දීමට එකඟ නොවිණි.<br>දැනට අලුත් ලොතරැයි මුද්‍රණකරුවකු තෝරා ගෙන සිටින අතර එම මුද්‍රණකරු විසින් අදාළ සියළු ලොතරැයිපත් Sweep App හරහා අලෙවි කිරීමේ කටයුතු සූදානම් කර ඇත. කෙසේ වෙතත් මෙම Sweep App සකස් කිරීම සඳහා මෘදුකාංග සංවර්ධන වියදමක් දරා නොමැත. | මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කළ හැකි මුද්‍රණ කොන්ත්‍රාත්කරු තෝරා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ත්‍යාග සඳහා මිලදී ගත් රු. 775,750ක් වටිනා මෝටර් බයිසිකල් 03ක්, වර්ෂ 13 ක කාලයක සිට පැවැත එන එකතුව රු.592,500 ක් වටිනා ත්‍යාග වවුචර්පත් 123 ක් හා ත්‍යාග සඳහා මිලදී ගත් එකතුව රු.5,053,530 ක් වටිනා රන් භාණ්ඩ දීර්ඝ කාලයක සිට ත්‍යාග සඳහා භාවිත නොකර පැවැතුණි. | ත්‍යාග සඳහා මිල දී ගත් මෝටර් බයිසිකල් 03 ට අදාළව 2018 අගෝස්තු 23 දින සුපර් බෝල්, 2018 ජනවාරි 26 දින කෝටිපති ශනිදා සහ 2020 ජනවාරි 30 දින සුපර් බෝල් විශේෂ ලොතරැයිපත්වල ත්‍යාග සඳහා ඇතුළත් කළ ඒවා වන අතර දිනුම් ඇදීමෙන් මාස 06ක් පසු වී ජයග්‍රාහකයින් ඉදිරිපත් නොවූ ත්‍යාග අයිතමයන්ය. | එම භාණ්ඩ ත්‍යාග ලෙස වෙනත් ලොතරැයිපත් සඳහා භාවිත කිරීමට හෝ එසේ නොවන විට අපහරණය කිරීමට හෝ කටයුතු කළ යුතු වීම. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ලෙස 341 දෙනෙකු අනුමත කර තිබුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නව නිර්මාණ, සංකල්ප හා ප්‍රචාරණ) තනතුර අනුමත කර නොතිබුණි. එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී මාස 04 ක කාලපරිච්ඡේදයක් වෙනුවෙන් එකතුව රු.634,955 ක් වැටුප් වශයෙන් ද, එකතුව රු.277,075 ක් දීමනා වශයෙන් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී නව ) නිර්මාණ, සංකල්ප හා ප්‍රචාරණ ( තනතුර සඳහා නිලධාරියෙකු ත් පදනම මත සේවා කොන්ත්‍රා තාවයට බඳවාඅවශ්‍යගැනීම සිදු කර ඇත ඒ සඳහා .2021 ජූලි 09 දින 254 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව මෙම බඳවා ගැනීම සිදු කර ඇතකෙසේ . නමුත්2021 දෙසැම්බර් 31 දිනෙන් පසු ඔහු සේවයෙන් ඉවත් වී ඇත. | අනුමත සේවක තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | එකඟ වේ. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වීම. |

## 4.2 වෙළඳපොල කොටස

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තරඟකාරී ආයතනය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මුළු වෙළඳපොල කොටස සියයට 48 ක් විය. ඉකුත් වර්ෂ 5 ක කාලය තුළ සියයට 43 ක සිට සියයට 47 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් පැවතුණි. | කලින් කලට වෙළඳපොලේ සිදුවන තරඟකාරී වෙළඳපොල උපක්‍රම හේතුවෙන් වෙළඳපොල කොටස වෙනස් වේ. | වෙළඳපොල කොටස වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| ආ | මණ්ඩලය විසින් ස්වකීය තරඟකාරී ආයතනයක් ලෙස සඳහන් කරන ලද ජාතික ලොතරැයි මණ්ඩලයේ ටිකට්පත් එකම අලෙවි කුටි තුළ එකම අලෙවි නියෝජිතයින් මඟින් අලෙවි කිරීම සහ මණ්ඩලයේ රථ මගින් ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි පත් දුර පළාත්වලට බෙදාහැරීම සිදුකළද මණ්ඩලයේ ආරම්භයේ සිට මේ දක්වාම ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ ඒ සඳහා නිශ්චිත ගිවිසුමකට හෝ එකඟතාවයකට හෝ එළඹ නොතිබුණි | එකඟ වේ | මණ්ඩලයේ අවදානම පිළිබඳ අවධානය යොමු කර ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ ලිඛිත එකඟතාවයකට හෝ ගිවිසුමකට එළඹිය යුතු වීම |